# උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය

**(1987 අංක 50 දරන පනත යටතේ ස්ථාපිත කරන ලද)**

# පුරප්පාඩු

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී - II ශ්‍රේණිය - JM 1-1 (පුරප්පාඩු 01)

**1.1 තනතුරට පැවරෙන කාර්යයන්**

ආයතනයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ජාල කළමනාකරණය හා ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම උපකරණ අලුත්වැඩියාවන්, නඩත්තු කිරීම, පරීක්ෂා කිරීම හා අදාළ ක්ෂේත්‍රයේ කටයුතු අධීක්ෂණය, විෂය ක්ෂේත්‍රයට අදාළ සියළුම යාවත්කාලීන කිරීම්, වාර්තා සකස් කිරීම, ඉදිරිපත් කිරීම ඇතුළුව විෂයපථයට අදාළව අංශ ප්‍රධානී හා ප්‍රධාන විධායක නිලධාරී පවරන වෙනත් කාර්යයන්

**1.2 සුදුසුකම්**

**1.2.1 බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4)**

1. තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ජාල කළමනාකරණය හෝ ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයක විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.
2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ජාල කළමනාකරණය හෝ ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ජාල කළමනාකරණය හෝ ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.
4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ජාල කළමනාකරණය හෝ ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස් (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**1.2.2 අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. 'කළමනාකරණ සහකාර - තාක්ෂණ' (MA 2-2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ

**වැටුප් පරිමාණය** : JM 1-1 - රු. 72,650/= 10X1,360 – 18X2,040 – 122,970/=

**ආරම්භක මූලික වැටුප :** රු. 65,633/= (2026)

**(ඉහත වැටුප් පරිමාණය ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 1/2025 අනුව ඉදිරිපත් කර ඇති අතර, මෙම පරිමාණයේ සඳහන් ආරම්භක වැටුප් පියවර 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ. මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)**

## 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර - III ශ්‍රේණිය - MA 2-2 (පුරප්පාඩු 01)

**2.1 තනතුරට පැවරෙන කාර්යයන්**

ආයතනයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ජාල කළමනාකරණය හා ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම උපකරණ අලුත්වැඩියාව සම්බන්ධ කටයුතු කිරීම, සියලුම උපකරණ නඩත්තු කිරීම, පරීක්ෂා කිරීම , නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, සියලුම යාවත්කාලීන කිරීම්, විෂය ක්ෂේත්‍රයට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම හා විෂයපථයට අදාළව අංශ ප්‍රධානී හා ප්‍රධාන විධායක නිලධාරී පවරන වෙනත් කාර්යයන්

**2.2 සුදුසුකම්**

**2.2.1 බාහිර අයදුම්කරුවන්:-**

අදාළ තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ජාල කළමනාකරණය හෝ ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයක කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**2.2.2. අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය** : MA 2-2 - රු. (50,540 - 10 X 540 - 7 X 630 - 4 X 1,080 - 20 X 1,280 - 90,270)

**ආරම්භක මූලික වැටුප :** රු. 46,960/= (2026)

**(ඉහත වැටුප් පරිමාණය ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 1/2025 අනුව ඉදිරිපත් කර ඇති අතර, මෙම පරිමාණයේ සඳහන් ආරම්භක වැටුප් පියවර 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ. මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)**

**පොදු කොන්දේසි**

අ. සෑම ඉල්ලුම්කරුවෙක්ම

- I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- II තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- III විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

ආ. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, විශ්‍රාම වැටුප් රහිතය. ස්ථාන මාරුවීම් නොමැත.

ඇ. සියලු අයදුම්කරුවන් කළමනාකරණ මණ්ඩලය මගින් තීරණය කරනු ලබන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පසු තෝරා ගැනීම සිදු කෙරේ.

ඈ. සේ.අ.අ. සඳහා වැටුපෙන් 10% ක මුදලක් සේවා දයකයා විසින් ගෙවිය යුතු අතර, සේ.අ.අ. සඳහා 12% ක සහ සේ.නි.භා.අ. සඳහා 3% ක මුදලක් සේවායෝජකයා විසින් දායක මුදල් ලෙස ගෙවනු ලැබේ.

ඉ. තෝරා ගන්නා අයදුම්කරුවන්ට වෛද්‍ය, හදිසි අනතුරු රක්ෂණ පහසුකම් යනාදී ප්‍රතිලාභ හිමිවේ.

ඊ. ඉහත සුදුසුකම් සහ තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත් වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා අයදුම්පත සමග එවිය යුතුය. (සහතිකපත් වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

උ. ඉහත අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දින පසු වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලබන අතර, ලද අයදුම්පත් වලින් වැඩිම සුදුසුකම් ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවන බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

ඉහත තොරතුරු ඇතුළත් අයදුම්කරු පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකයන් ඇතුළත් කරන ලද සම්පූර්ණ ජීව දත්ත සටහනක් ද සහිත අයදුම්පත් 2026.06.15 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

**ප්‍රධාන විධායක නිලධාරී / මාර්ෂල්,**
**උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය,**
**තැ.පෙ.223, කොළඹ 12.**
**01/06/2026**